# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

## බාහිර උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි කිරීම
## 2026/2027 අධ්‍යයන වර්ෂය

### විද්‍යාවේදී (ගෞරව) බහු අවයවික නිමැවුම් නිෂ්පාදනය සහ කර්මාන්ත කළමනාකරණය බාහිර උපාධි පාඨමාලාව

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ
බහුඅවයවික විද්‍යා අධ්‍යයනාංශය මඟින් පිරිනමනු ලබන
ඉහත සඳහන් බාහිර උපාධි පාඨමාලාව සඳහා
2026-06-10 වන දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සැලකිය යුතුයි !!**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයට අනුබද්ධ කිසිදු නියෝජිත ආයතනයක් නොමැත. එබැවින් අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා external.sjp.ac.lk යන වෙබ් අඩවියට පිවිස මෙහි සඳහන් ක්‍රමවේදය පමණක් අනුගමනය කළ යුතුය. වෙනත් නියෝජිතායතන හරහා ඉදිරිපත් කරන අයදුම්පත් පිළිබඳව විශ්වවිද්‍යාලය වගකියනු නොලැබේ.



## අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය

අයදුම්පත් යොමු කළ හැක්කේ මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ පමණි.
ඒ අනුව external.sjp.ac.lk වෙබ් අඩවියට හෝ පහත QR කේතය ස්කෑන් කර (Scan) නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත යොමු කළ (Submit) යුතුය.

**අයදුම්පත යොමු කිරීමේදී පහත සඳහන් ලේඛන ස්කෑන් කර (Scan) උඩුගත කළ යුතුය.**

- සහතික කරන ලද උප්පැන්න සහතිකයේ පිටපතක්.
- අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්.
- ජාතික හැඳුනුම්පතේ සහතික කරන ලද පිටපතක්.
- අයදුම්පත් ගාස්තුවට (රු. 5000.00) අදාලව බැංකුවට මුදල් ගෙවන ලද රිසිට්පතේ මුල් පිටපත හෝ Visa හෝ Master debit / credit කාඩ්පත් මගින් ගෙවීම් කරන්නේ නම් ගෙවීම් කළ බව තහවුරු කිරීමේ මුද්‍රිත සාක්ෂි සටහනක් (Online receipt)

ඉහත සඳහන් ලේඛනවල පිටපත් සමග සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඪ පිටපතක් (Hard copy) පහත සඳහන් ලිපිනයට 2026-06-10 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (සැ. යු. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි තමා ඉල්ලුම් කරන උපාධි පාඨමාලාවේ නම සඳහන් කර එවිය යුතුය)

අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය
නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
අංක 16, එස් ඩී එස් ජයසිංහ මාවත,
කොහුවල, නුගේගොඩ

- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**උපාධි පාඨමාලා විස්තර, ගෙවීම් සිදු කිරීම සහ අයදුම්පත් යොමු කළ යුතු ආකාරය ඇතුලු සියලු විස්තර සඳහා පිවිසෙන්න**
**external.sjp.ac.lk**

ලේඛකාධිකාරී
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
2026.05.10

COMMERCIAL DISTRIBUTION IS STRICTLY PROHIBITED
PRINTED FROM PRESSREADER
NOT FOR SALE
PERSONAL COPY